*සැ. යු.* -2018.06.14 දින පළ වූ අංක 2076 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,077 - 2018 ජූනි මස 22 වැනි සිකුරාදා - 2018.06.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1370 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1370 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූලි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන් යටතේ බඳවාගත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගැනීම - 2018

2018.05.25 දින පළකරන ලද අංක 2073 දරන *ගැසට් පත්‍රයේ* 05-681/2 යන නිවේදනයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.07.16 දක්වා දීර්ඝ කරමි.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්.

2018 ජුනි මස 19 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

06-1149/1

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ඇමුණුම : 01

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2018 දෙවන අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආයතනවල වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 2018 දෙවන අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර තිබේ. එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලයද සඳහන් කර ඇත. වෘත්තීය පුහුණු අධිකාරියේ සියලුම පූර්ණකාලීන පාඨමාලා නොමිලේ හැදෑරිය හැකිය.

පාඨමාලා සඳහා අයදුම් කිරීම :

දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික වෘත්තීය පුහුණු ආයතනවල ලිපිනය හා ක්‍රියාත්මක පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබෙන අතර ඔබ කැමති පාඨමාලාවක් තෝරාගෙන අදාළ දිස්ත්‍රික්කයට/ජාතික වෘත්තීය පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම් පතක් යොමුකළ යුතුය. මේ සමග ඉදිරිපත් කරන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව යොමු කළ යුතුය. ඔබ විසින් අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2018 - II පාඨමාලා සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2018 ජූලි මස 02 |
| වැඩි විස්තර සඳහා— | | |
| දුරකථන අංක | - | 011-7277888<br>011-7270270<br>011-2352185<br>011-2352160<br>011-2555407 |
| ෆැක්ස් අංකය | - | 011-2502342 |
| ඊ - මේල් ලිපිනය | - | cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - | www.vtasl.com |
| ෆේස්බුක් පිටුව | - | www.facebook.com/vtasl |

ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්තු
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,

04 මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

*ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ*

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබාගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබාගැනීමේ අවස්ථාව
- විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනාවක්
- සහනදායි මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- මාසික දීමනාවක් සමගින් වැඩිදුර පුහුණුව
- රජයේ පිළිගත් සහතිකයක්
- විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමග ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මගින් දැනුම යාවත්කාලීන කිරීම
- වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව

**ආදර්ශ අයදුම් පත්‍රය**

*ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය*

*2018 දෙවන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයන් බඳවා ගැනීම*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................

2. ලිපිනය : ..................................................................

3. පදිංචිය : ..................................................................
   (i) ග්‍රාමසේවා වසම :..................................................................
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..................................................................
   (iii) දිස්ත්‍රික්කය :..................................................................

4. දුරකථන අංකය : ..................................................................

5. උපන් දිනය : ..................................................................

6. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

   ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම : ..................................................................

7. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| *පාඨමාලාව* | *අදාළ මධ්‍යස්ථානය* |
|---|---|
| (i) ........................... | (i) ........................... |
| (ii) ........................... | (ii) ........................... |
| (iii) ........................... | (iii) ........................... |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂගේ ලිපිනයට යොමු කරන්න. පාඨමාලා ආරම්භය 2018 ජූලි 02.

**පාඨමාලාව හැදෑරීම සඳහා අවම සුදුසුකම්**

*08 වසර සමත්වීම*

- Book Binder - NVQ - 3

*09 වසර සමත්වීම*

- ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - NVQ - 3,4
- ජලනල කාර්මික - NVQ - 3
- උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී - NVQ -3,4
- ලී කැටයම් ශිල්පී- Non
- මෝටර් රථ පින්තාරු ශිල්පී - NVQ -3,4
- මෝටර් රථ වෑද්දුම් ශිල්පී - NVQ -3,4
- යතුරුපැදි කාර්මික ශිල්පී -NVQ -3,4
- ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී - NVQ -3,4
- පළතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු - NVQ - 3
- කාමර සේවක - NVQ - 3
- ලෝහ පිරිසැකසුම්කරු - NVQ -3,4
- ස්වර්ණාභරණ ගල් බැඳීමේ ශිල්පී- NVQ -3,4
- පැල තවාන් සංවර්ධන සහායක -NVQ - 3
- අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී - NVQ -3,4
- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - NVQ -3
- ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - NVQ - 2,4
- තිර මුද්‍රණකරු (Screen Printer)- Non
- ඇඳුම් මැසීම (පිරිමි) - NVQ -3,4
- සම් භාණ්ඩ නිෂ්පාදන ශිල්පී- NVQ - 3
- රූපලාවන්‍ය ශිල්පී - NVQ -3,4
- කොණ්ඩා කැපුම් ශිල්පී - NVQ -3,4
- රියදුරු (සැහැල්ලු වාහන) - Non
- ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු (ස්කැවේටර්/ බැකෝ ලෝඩර්/ මෝටර් ග්‍රේඩර්) - NVQ - 3,4
- ස්වර්ණාභරණ ශිල්පී - NVQ -3,4
- පාවහන් ශිල්පී - NVQ - 3

*අ.පො.ස (සා.පෙළ) පෙනී සිටීම*

- ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ ) - NVQ -3,4
- ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) - NVQ - 4
- විදුලි මෝටර් එතුම් ශිල්පී - NVQ -3,4
- බේකරි ශිල්පී - NVQ -3,4
- වෘත්තීය සූපවේදී - NVQ -3,4
- භෝජනාගාර සේවක - NVQ -3,4
- ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී - NVQ -3,4
- ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - NVQ -2,4
- මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) - NVQ - 3,4
- විදුලි ශිල්පී (ගෘහස්ථ) - NVQ - 3
- විදුලි ශිල්පී (කර්මාන්ත) - NVQ -3,4
- ළමා සුරැකුම් ශිල්පී - NVQ - 4
- ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ / ගොඩනැගිලි) - NVQ - 4

*අ.පො.ස (සා.පෙළ) විෂයයන් 03කින් සමත්වීම*

- කෘෂි යන්ත්‍ර හා උපකරණ කාර්මික - NVQ - 2,3
- වෑද්දුම් ශිල්පී - NVQ - 3,4
- පැස්සුම් ශිල්පී - (Gas/Arc and MAG) NVQ - 3,4
- පැස්සුම් ශිල්පී - NVQ - 3, 4

*අ.පො.ස (සා.පෙළ) විෂයන් 06 කින් සමත්වීම*

- සැලසුම් ශිල්පී - NVQ -4
- මෝටර් රථ කාර්මික ශිල්පී - NVQ -3, 4
- මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - NVQ -3, 4
- මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - NVQ -3, 4
- ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම - NVQ - 3
- ශීතකරණ හා වායු සමීකරණ කාර්මික - NVQ -3, 4
- ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (ශ්‍රවණාබාධිත) (නාරාහේන්පිට) - NVQ - 4
- ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - NVQ - 4
- යන්ත්‍ර ශිල්පී - NVQ - 3, 4
- යන්ත්‍ර ශිල්පී (ලියවන පට්ටල් ක්‍රියාකරු) - NVQ - 3
- මෝස්තර නිර්මාණ ශිල්පී - NVQ - 4
- ඇඟළුම් නිෂ්පාදන සුපරීක්ෂක - NVQ - 4
- ඇඟළුම් තත්ත්ව පාලක - NVQ - 3
- ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම - NVQ - 3

*අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්වීම*

- පරිගණක දෘඩාංග ශිල්පී - NVQ - 4
- පරිගණක දෘඩාංග ශිල්පී +CISCO IT Essential (A+) NVQ - 3,4
- Adobe Certified Professional - NVQ - 4
- ලේකම් පරිචය - NVQ - 4

*අ.පො.ස (සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම*

- ගුවන් විදුලි, රූපවාහිනී සහ ගෘහ ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා ශිල්පී - NVQ -3,4
- නියුමැටික් ශිල්පී - NVQ -3,4

*අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්වීම*

- Computer Application Assistant- NVQ -3
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී - NVQ - 4

*අ.පො.ස (උ.පෙළ) සමත්වීම*

- වැඩ අධ්‍යයන නිලධාරි - NVQ -4

*අ.පො.ස ( උ.පෙළ ) විෂයන් 02 කින් සමත්වීම*

- සහකාර ප්‍රමාණ සමීක්ෂණ - NVQ - 4
- Fashion design Technology - NVQ -5

*අ.පො.ස. (උ.පෙළ) ගණිතය හෝ විද්‍යා අංශයෙන් විෂයයන් 03 කින් සමත්වීම හෝ NVQ 4 සුදුසුකම්*

- ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා - NVQ - 5

*ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2L3 සහතික ලබා තිබීම*

- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ක්‍රියාකරු) - NVQ - 4
- යන්ත්‍ර ශිල්පී (CNC මෙහෙයුම් යන්ත්‍ර ලියවන පට්ටල් ක්‍රියාකරු) - NVQ - 4

**පිලිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවීම හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික, වැඩ මූලික සහයක, වැඩ අධීක්ෂණ රැකියාවක වසර 02 ක පළපුරුද්ද තිබීම**

- කාර්මික කළමනාකරණ ඩිප්ලෝමාව - Non

*අ.පො.ස. (සා.පෙළ) සමත්වීම හා ICT මූලික දැනුම ලබා තිබීම*

- Web Designer - NVQ - 4

*අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සමග විෂයයන් 06ක් සමත් වීම හෝ ICT සඳහා NVQ 3/ NVQ 4 සහතිකය ලබා තිබීම හෝ අ.පො.ස. ( උ.පෙළ ) විෂයයන් 03ක් ගණිතය/විද්‍යාව/තාක්ෂණ විෂය ධාරාවෙන් සමත්වී තිබීම*

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී - NVQ - 5

*ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් අ.පො.ස. (උ.පෙළ) පෙනී සිටීම*

- පෙර පාසල් - NVQ - 4

NVQ 3 ලබා තිබීම (අදාළ ක්ෂේත්‍රය තුළ)

- ඉදිකිරීම් තාක්ෂණ ශිල්පී - NVQ - 5

*අදාළ ක්ෂේත්‍රය තුළ වැඩිදුර පුහුණුව නිම කිරීම*

- Audio/Video- Non
- Home Appliances- Non
- Air Conditioner- Non
- ජංගම දුරකතන අළුත්වැඩියාව- Non

අයදුම්පත් තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ වෙතට යොමු කරන්න.
පාඨමාලා ආරම්භය 2018 ජූලි 02.

| 2018 - II අර්ධ වර්ෂය | | | |
|---|---|---|---|
| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමග)* | *NVQ Levels* |
| | **මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව** | | |
| 1 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 2 | රියදුරු (බර වාහන) | 6 | Non |
| 3 | රියදුරු (සැහැල්ලු වාහන) අර්ධ කාලීන | 6 | Non |
| 4 | මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 5 | මෝටර් රථ වැද්දුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 6 | යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 7 | ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී | 6 | 3 |
| 8 | ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරු (ස්කැවේටර්/බැකෝ ලෝඩර්/මෝටර් ග්‍රේඩර්) | 2 | 4, Non |
| 9 | මෝටර් රථ කාර්මික ශිල්පී පාඨමාලාව | 24,36 | 3,4 |
| 10 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 24 | 3,4 |
| 11 | කෘෂි යන්ත්‍ර හා උපකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 24 | 3 |
| | **විදුලි විද්‍යුත් සහ විදුලි සංදේශ** | | |
| 12 | විදුලි ශිල්පී - ජාතික සහතිකය | 18 | 3,4 |
| 13 | විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 14 | විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී (Electronic Appliances) | 24 | 4,3 |
| 15 | ජංගම දුරකතන අළුත්වැඩියා කරන්නා | 12 | Non |
| 16 | ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය | 24 | 3 |
| 16.1 | නියුමැටික් ශිල්පී (Pneumatic Technician) | 18 | 4 |

| 2018 - II අර්ධ වර්ෂය | | | |
|---|---|---|---|
| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමග)* | *NVQ Levels* |
| | **තොරතුරු සන්නිවේදන තාක්ෂණය** | | |
| 17 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය + CISCO IT Essential (A+) | 12 | 4 |
| 18 | Adobe Certified Accociate Certification + NVQ Level 4 | 12 | 4 |
| 19 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය (NVQ Level 5 in ICT Additional Oracle Academy Java programming and data base certification training) | 15 | 5 |
| 20 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NVQ Level 4 in ICT) | 12 | 4 |
| 21 | CISCO Certiffied Network Accociate (CCNA +NVQ Level 4) | 12 | 4 |
| 22 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 4 |
| 23 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (ශ්‍රවණාබාධිත) (නාරාහේන්පිට) | 12 | 4 |
| 24 | Web Designing & Development (NVQ Level 4) (මහනුවර/ කටුගස්තොට/බද්දේගම) | 12 | 4 |
| 24.1 | Computer Application Assistant | 6 | 3 |
| | **හෝටල් හා සංචාරක** | | |
| 25 | සූපවේදී - ජාතික සහතිකය | 12 | 4 |
| 26 | කාමර සේවක - ජාතික සහතිකය | 12 | 3,4 |
| 27 | භෝජනාගාර සේවක - ජාතික සහතිකය | 12 | 3,4 |
| 28 | පිළිගැනීමේ නිළධාරිනී - ජාතික සහතිකය | 6 | 3,4 |
| | **මැණික් හා ස්වර්ණාභරණ** | | |
| 29 | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය | 12 | 3 |
| 30 | ස්වර්ණාභරණ කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 24 | 3,4 |
| | **පුද්ගල හා සමාජ** | | |
| 31 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය /ඩිප්ලෝමා (නාරාහේන්පිට) | 6,12 | 4,5 |
| 32 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | 6 | 4,3 |
| 33 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය/ඩිප්ලෝමා (නාරාහේන්පිට) | 6 | 4 |
| 34 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 3 |
| 35 | පෙර පාසල් - ජාතික සහතිකය | 24 | 3 |
| 36 | ළමා සුරැකුම් (Child Care) - ජාතික සහතිකය | 12 | 4 |
| 36.1 | Elder Care (NVQ Level - 3) | 12 | 3 |
| 36.2 | ජන සන්නිවේදනය පිළිබඳ පාඨමාලාව | 3 | Non |
| | **ආහාර තාක්ෂණය** | | |
| 37 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 38 | පළතුරු හා එළවළු නිෂ්පාදන සැකසුම්කරු | 12 | 3 |
| | **දැව ආශ්‍රිත** | | |
| 39 | ලී කැටයම් ශිල්පී | 12 | Non |
| 40 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 12,24 | 3,4 |
| 41 | ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 24 | 3,4 |
| | **රෙදිපිළි හා ඇගළුම්** | | |
| 42 | මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 4,3 |
| 43 | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 44 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6 | 3,4 |
| 45 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | 12 | 2,3,4 |
| 46 | තිර මුද්‍රණකරු | 12 | Non |
| 47 | ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 12 | 3,4 |
| 48 | ඇඟළුම් නිෂ්පාදන සුපරික්ෂක - ජාතික සහතිකය | 12 | 3 |
| 49 | ඇඟළුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය | 12 | 3,4 |

| 2018 - II අර්ධ වර්ෂය | | | |
|---|---|---|---|
| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය (කර්මාන්තශාලා පුහුණුව සමග)* | *NVQ Levels* |
| 50 | අඟළුම් තත්ව පාලක - ජාතික සහතිකය (Keggala) | 12 | 4 |
| 51 | වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය | 24 | 4 |
| 51.1 | Fashion Design Technology | 24 | 4,5 |
| | **ශීතකරණ හා වායු සමීකරණ** | | |
| 52 | ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය | 24 | 3,4 |
| | **ලෝහ හා ලුහු ඉංජිනේරු** | | |
| 53 | යන්ත්‍ර ශිල්පී (ලියවන පට්ටල් ක්‍රියාකරු) | 12 | 3 |
| 54 | යන්ත්‍ර ශිල්පී - (CNC Milling Machine Operator) - නාරාහේන්පිට | 12 | 4 |
| 55 | යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය | 24 | 4,3 |
| 56 | යන්ත්‍ර ශිල්පී - (CNC Milling & Lathe Machine Operator) (නියාගම/වන්දාරමුල්ල) | 12 | 4 |
| 57 | පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 12,24 | 2,3,4 |
| 58 | පෑස්සුම් ශිල්පී | 12 | Non |
| 58.1 | ලෝහ පිරිසැකසුම්කරු (Fabricator - Metal) | 12 | 2 |
| 59 | වෑද්දුම් ශිල්පී ජාතික සහතිකය | 12 | 3 |
| | **ගොඩනැගිලි හා ඉදිකිරීම්** | | |
| 60 | ඇළුමිනියම් පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | 12 | 3,4 |
| 61 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය | 12,18 | 3,4 |
| 62 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) | 6 | 3 |
| 63 | ජලනල කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12,18 | 3,4 |
| 64 | සහකාර ප්‍රමාණ සමීක්ෂණ - ජාතික සහතිකය | 12 | 4 |
| 65 | උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | 12 | 3,4 |
| 66 | ඉදකිරීම් තාක්ෂණ ශිල්පී | 12 | 5 |
| 67 | ප්‍රමාණ සමීක්ෂණ ශිල්පී (ඩිප්ලෝමා) | 48 | 5,6 |
| 68 | සැලසුම් ශිල්පී (Draughtsperson) | 12 | 4 |
| | **මුද්‍රණ හා ඇසුරුම්** | | |
| 69 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 12 | 2,3,4 |
| 69.1 | Book Binder | 6 | 3 |
| | **කෘෂිකර්ම වැවිලි සහ පශු සම්පත්** | | |
| 70 | තවාන් පාලනය හා පැල බද්ධකරු | 12 | 3 |
| 71 | එළවළු හා පළතුරු වගාකරු | 12 | Non |
| | **සම් ආශ්‍රිත නිෂ්පාදන** | | |
| 72 | පාවහන් ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 |
| 73 | සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී - ජාතික සහතිකය | 12 | 3 |
| | **කාර්යාල කළමණාකරණය** | | |
| 74 | ලේකම් පරිචය (Footwear Craftman) - ජාතික සහතිකය | 12 | 4 |
| | **ධීවර හා මත්ස්‍ය වගාව ක්ෂේත්‍රය** | | |
| 76 | මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්) - ජාතික සහතිකය | 12,24 | 3 |
| | **වෙනත්** | | |
| 77 | ඉංග්‍රීසි හා මෘදු කුසලතා පාඨමාලා | 240hrs/300hrs | Non |
| 78 | Diploma in Industrial Management (Narahenpita) | 6 | Non |

2018 - II අර්ධ වර්ෂය

| ජා. වෘ. පු. ආ. | පාඨමාලා අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා අංකය | ජා. වෘ. පු. ආ. | පාඨමාලා අංකය | දිස්ත්‍රික්කය | පාඨමාලා අංකය |
|---|---|---|---|---|---|---|---|
| නාරාහේන්පිට | 01,03,18,20.1,23,25,27,31,32,33,36.2,37,51.1,54,60,69,77,78 | ගම්පහ | 03,06,07,09,10,12.1,13,15,17,20,22,24,24.1,25,32,33,37,40,41,42,43,44,45,47,58.1,60,63,65,77 | ත්‍රිකුණාමලය | 12.1,20,25,26,27,32,33, 37,40,45,57,60,61,63 | රත්නපුර | 05,07,12.1,13,17, 20,25,29,32,33,37,40,42,43,45,47,57,60,61,63 |
| රත්මලාන | 17,20,22,60,61,65 | ගාල්ල | 03,04,05,06,07,09,12.1,13,15,17,20,22,26,30,32,33,38,42,43,44,45,46,49,51,57,60,63,65,69,69.1,70,77 | බදුල්ල | 07,09,12.1,13,17,20,22,25,26,27,32,33,37,40,45,49,57,60,61, 63 | අම්පාර | 07,12.1,13,17,20, 25,26,27,32,33,35,37,40,44,45,47,49,57,60,61,63,64,77 |
| මිරිජ්ජවිල | 03,17,20,32,33,58,58.1,65,77 | කළුතර | 01,03,07,09,12.1,13,17,20,22,25,26, 30,32, 33, 36, 37, 38, 40,42, 44, 45, 47, 48, 49,52, 57, 58. 1, 60, 61,65, 70 | මොණරාගල | 07,09,12.1,13,14,17,20,25,32,33,35,37,40,43,45,47,52,53,57,60,61,68 | මඩකලපුව | 07, 12.1, 13, 20,32, 33, 37, 40, 45,47,57,60,61,63 |
| බද්දේගම | 13,17,20,25,27,36,37,60,63 | මහනුවර | 07,12.1,13,17,20,24,25,26,27,32,33,36,40,45,57,60,61,65 | මාතර | 05,07,12.1,13,20,22,32,33,40,42,43,45,46,49,52,57,60,61,63 | නුවරඑළිය | 07,09,12.1,17,20,25,26,27,32,33,37,40,45,49,57,60 |
| නියාගම | 09,14,17,20,26,27,32,33,55,61,63,77 | මාතලේ | 07,12.1,17,20,25,27,32,33,37,39,40,42,45,46,52,57,60,61,65,74,77 | කුරුණෑගල | 01,04,07,14,20,25,27,32,33,36,37,39,40,42,43,45,46,49,57,60,61,63,65 | කොළඹ | 01,07,12.1,17,20,22,25,29,32,33,36,37,44,45,47,57,58.1, 60,61,63,65 |
| තලල්ල | 03,17,20,25,27,32,33,37,40,55,57,60,63,65 | පොළොන්නරුව | 07,12.1,17,20,32,33,37,40,44,45,57,60,61 | කෑගල්ල | 03,04,07,12.1,13,17,20,22,25,30,32,33,40,41,45,57,60,61,65 | යාපනය | 07,12.1,17, 20,22,25,26,27,32,33,37,40,45,57,60,61,63,77 |
| වන්දාරමුල්ල | 07,20,32,33,56 | අනුරාධපුරය | 01,03,07,09,12.1,13,17,20,25,27,32,33,37,40,44,45,46,57,60,61,63,65,72 | පුත්තලම | 07,12.1,13,17,20,22,25,26,27,32,33,37,40,45,60,61,64 | කිලිනොච්චිය | 07,12.1,17,20,32,33,35,36,40,41,45,57,60, 61,63,64,68 |
| මුලතිව් | 07,12.1,17,20,32,33,37,45,47,60,63 | මන්නාරම | 12.1,20,40,45,63 | හම්බන්තොට | 01,04,05,07,12,12.1,13,17,20,22,25,26,27,32,33,37,40,42,44,45,47,57,60,61,63,64,77 | වව්නියා | 06,12.1,17,20,22,32,33,40,45,57,60,61,63,73 |

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

### ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට

*2018 වසරේ දෙවන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම*

### පූර්ණ කාලීන පාඨමාලා

| No. | Course | NVQ Level | Duration (Months) | Qualifications |
|---|---|---|---|---|
| 1 | Adobe ACA - Graphic Designer | IV | 6 | D |
| 2 | NVQ - IV in ICT (ICT Technician) - Tamil Medium | IV | 6 | J |
| 3 | Computer Graphic Designer Hearing Impaired) | IV | 6 | B |
| 4 | Baker | IV | 6 | A |
| 5 | Cook | IV | 6 | A |
| 6 | Waiter/Steward | IV | 6 | I |
| 7 | Automobile A/C Mechanic | IV | 6 | A |
| 8 | Beautician | IV | 3 | B |
| 9 | Hair Dresser | Iv | 3 | B |
| 10 | Diploma in Industrial Management | Non | 6 | E |
| 11 | Offset Lithographic Operator | IV | 6 | I |
| 12 | Machinist (CNC Milling) | IV | 6 | C |
| 13 | Aluminium Fabricator | IV | 6 | I |
| 14 | Special Course in Mass Communication | Non | 6 | G |

පූර්ණ කාලීණ පාඨමාලා සඳහා 2018.06.15 දිනට වයස අවු. 16 ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨාමාලා සෙනසුරාදා/ඉරිදා දිනයන්හි හා* සන්ධ්‍යා කාලීනව ද පැවැත් වේ.

### අර්ධ කාලීන පාඨමාලා

| Course | Duration (Hours) | Qualifications | Course Fee (Rs.) |
|---|---|---|---|
| Higher National Diploma in Fashion Design (V/VI) | 2 Yrs. | N | 150,000.00 |
| Quantity Surveyor (NVQ VI) | 1500 | Q | 100,000.00 |
| Cosmtology (NVQ V) | 840 Hrs. | F | 110,00.00 |
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 15,000.00 |
| CCNA Routing & Switcing | 300 | D | 40,000.00 |
| PC Based Application Assistant (MS Office) | 100 | I | 9,500.00 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 25,000.00 |
| Computer Graphic Designer* | 150 | H | 10,000.00 |
| ICT Technician (NVQ IV) | 350 | A | 25,500.00 |
| Photographer (NVQ IV) | 298 | L | 40,000.00 |
| Auto Cad (2D) | 80 | K | 7,500.00 |
| Baker (NVA IV) | 460 | B | 36,500.00 |
| Baker* | 100 | B | 14,000.00 |
| Cook | 100 | B | 14,000.00 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250.00 |
| Facials & skin care Treatment | 100 | B | 10,500.00 |

| Course | Duration (Hours) | Qualifications | Course Fee (Rs.) |
|---|---|---|---|
| Make up & Bridal Dressing | 80 | B | 11,000.00 |
| Auto Mobile Technician (Engine/Petrol/Diesel) | 160 | B | 14,500.00 |
| Draughtsman ship (Building Drawing) | 150 | D | 13,500.00 |
| CNC Programming | 125 | A | 9,000.00 |
| Electrical Wiring Industrial* | 120 | A | 14,500.00 |
| Electrical Wiring Domestic* | 120 | A | 13,000.00 |
| Motor Control System | 100 | A | 13,000.00 |
| Automobile A/C Mechanic* | 125 | B | 13,000.00 |
| Pre School Teacher* | 100 | A | 15,000.00 |
| English (NVQ I) | 200 | I | 8,400.00 |

NVQ 3 = G.C.E. O/L සහ NVQ 4 = G.C.E. (A/L) (අදාළ ක්ෂේත්‍ර තුළ)

ප්‍රතිලාභ

- සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු නිදහස් කර ඇත.
- දේශීය විදේශීය රැකියා අවස්ථා.
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහුසකම්.
- ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්.
- විෂය දැනුමට අමතර ඉංග්‍රීසි දැනුම.
- දීමනා සමග මාස 06 වැඩිදුර පුහුණුව.

සුදුසුකම්

A. අ.පො.ස. (සා.පෙළ) විෂයන් 06 කින් සමත් වීම.
B. 9 වසර සමත් වීම.
C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.
D. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.
E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/ වැඩ මූලික සහායක/ වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.
F. රූපලාවන්‍ය හෝ කොණ්ඩා සැකසුම් ශිල්පී NVQ Level IV ලබා තිබීම.
G. අ.පො.ස. (සා.පෙළ) සිංහල සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.
H. අ.පො.ස. (සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
I. අ.පො.ස. (සා.පෙළ) පෙනී සිටීම.
J. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත් වී තිබීම.
K. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.
L. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.
M. ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව හදාරා NVQ Level V මට්ටම ලබා තිබීම.
N. අ.පො.ස. (උ.පෙළ) සමත් වීම හෝ Tailor/Pattern Maker NVQ Level 4 ලබා තිබීම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2018.06.30 දිනට පෙර පහත ලිපිනයට එවන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය.

354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.
දුරකතන : 011-2592233
011-7277111 (IT Centre)
ඊ මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112-553856, 011-2592233

06-777

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (II) 2018

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අදළ අනුමත සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 සැප්තැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගයට අදළ වන අයදුම්කරුවන් පිළිබඳව අංක 1840/34 සහ 2013.12.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදය, 15 අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම 04 හි තොරතුරු දක්වා ඇත.

3.0 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ, III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද එහෙත් එම විභාගයෙහි (1) කාර්යාල ක්‍රම (2) ගිණුම් ක්‍රම හා (3) පරිගණක පරීක්ෂණය යන විෂයයන් එකක් හෝ කිහිපයක් සමත් වූ හෝ නිදහස් කරන ලද නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවෙහි III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි අදළ විෂයයන්ගෙන් විෂයයෙන් විෂයයට පදනම මත නිදහස් කරනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළත මෙම විභාගය සමත් විය යුතුය.

4.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුරය හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදළ නගර හා නගර අංක පහත වගුවේ දක්වේ. ඉල්ලුම් කල නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුරය | 24 |
| කිලිනොච්චිය | 25 |

ඉහත කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

5.0 (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

6.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රය අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2018 ජූලි මස 23 දින හෝ ඊට පෙර ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධානය හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ. 1503,<br>
කොළඹ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

***සටහන.***-මෙම *ගැසට්* නිවේදනයට සමගාමීව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මගින් ද අනෙකුත් අදළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව

සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතුවේ. ඒ අනුව **ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ.** එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

7.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව - අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

8.0 අයදුම්පත්‍ර - අංක 1.0 සිට 3.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි ''ඒ 4'' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලුම තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කර ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉල්ලුම්කරන එක් විෂයයක් සඳහා රු. 250 ක් ද විෂයයන් දෙකක් හෝ සම්පූර්ණ විභාගය සඳහා ඉල්ලුම්කරන්නේ නම් රු. 500 ක් ද වශයෙන් විභාග ගාස්තුව ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තු වලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව කාරුණිකව දන්වමි. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

9.0 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හො විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තම ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තරය සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ නම්, ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.0 අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාගයට පෙනී සිටින පළමු දිනයේදීම විභාග

ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.1 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

11.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති වන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එසේවුවද වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40% ක්) නිලධාරීන් විසින් ලබාගත යුතුවේ.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

14.0 විභාග පරිපාටිය : අයදුම්කරුවන් පහත දක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම | 01 | 100 යි | පැය 02යි |
| 2. | ගිණුම් ක්‍රම | 02 | 100 යි | පැය 02 යි |
| 3. | පරිගණක පරීක්ෂණය | 03 | 100 යි | පැය 01 1/2 යි |

14.1 කාර්යාල ක්‍රම (විෂය අංකය - 01)

රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරී ලිපිලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25 යි.)

II වන කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75 යි)

14.2 ගිණුම් ක්‍රම (විෂය අංකය -02)

රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම් මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් තුනකට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75 යි)

14.3 පරිගණක පරීක්ෂණය (විෂය අංකය - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) වදන් සැකසුම
මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය
පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම
පිම් අනුයෝගය (Tab Setting), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය,
අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද
තීරු යෙදීම, පිටු සැකසීම

ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම
ගොනු කළමනාකරණය
ලේඛනයක් ලිපිනයක් කිහිපයකට යැවීමට සැකසීම
මැක්‍රෝ භාවිතය

(v) පැතුරුම්පත්
මූලික කුසලතා
ආකෘතිකරණය (Formatting)
සංස්කරණය
තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්
දත්ත අනුපිළිවෙළට සැකසීම
ප්‍රස්තාර සැකසීම
මුද්‍රණය
@ශ්‍රිතය (@ Function)
මැක්‍රෝ භාවිතය
ගොනු කළමනාකරණ

(iv) අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල
අන්තර්ජාලය හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපැල ලබා ගැනීම
විද්‍යුත් තැපැල යැවීම, ඊට ප්‍රතිචාර දැක්වීම
ඇමුණුම භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය
පණිවුඩ සම්පාදනය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වන කොටස - බහුවරණ/කෙටි පිළිතුරු ප්‍රශ්න 40කින් යුක්ත වේ. කාලය මිනිත්තු 45යි. (ලකුණු 40යි)
II වන කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. කාලය මිනිත්තු 45 යි. (ලකුණු 60).

15.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

17.0 ''සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.''

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2018 ජුනි මස 07 වැනි දින,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**ආදර්ශ අයදුම්පත**

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012(II) 2018**
**Efficiency Bar Examination for Officers in Grade III of Public Management Assistants' Service - 2012 (II) 2018**

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| (ගැසට් නිවේදනයේ 4.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) | | |

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 6.0 ඡේදයේ සටහන බලන්න.) ☐

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය |
|---|
| සිංහල - 2<br>දෙමළ - 3<br>ඉංග්‍රීසි - 4 ☐ |
| (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA )
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් (ගැසට් නිවේදනයේ 14.0 වන ඡේදය බලන්න.)

| අනු අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

5.0 දැනට දරන තනතුර
5.1 තනතුර :————.
5.2 පත්වීම් ලිපියේ අංකය :————.

6.0 6.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
6.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
6.3 තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
6.4 ලදුපත් අංකය :————.
6.5 දිනය :————.

සම්පූර්ණ විභාග ගාස්තුව රු. 500/- ක් ද, එක් විෂයක් සඳහා රු. 250/- ක් ද වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රු. . . . . . . . . . තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................................... මහතා/මහත්මිය/මෙනවිය ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය***

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(ii) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,
(iii) නිලධාරියා/නිලධාරිනිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
(iv) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, මම සහතික කරමි.

* අදාළ නොවන වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
සහ නිල මුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-882

---

සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන් යටතේ බඳවාගත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරග විභාගය - 2018

2018.05.25 දින පළකරන ලද අංක 2073 දරන ගැසට් පත්‍රයේ 05-681/1 යන නිවේදනයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018.07.16 දක්වා දීර්ඝ කරමි.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්.

2018 ජුනි මස 19 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

06-1149/2

## සංශෝධනයයි

**විගණන පරීක්ෂක සේවයේ II වැනි ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

අංක 2071 හා 2018 මැයි 11 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද විගණන පරීක්ෂක සේවයේ II වැනි ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 සඳහා අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය 2018 ජූනි මස 29 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

එච්. එම්. ගාමිණී විජේසිංහ,
විගණකාධිපති.

2018 ජූනි මස 20 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

06 -1150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.